# වැදගත් නායකයා නොව සන්ධානයයි

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ශ්‍රී ල නි ප, ජ වි පෙ, ම එ පෙ, අෂ්රොෆ් මුස්ලිම් කොංග්‍රසය හා තවත් පක්ෂ කිහිපයක් එක් වී බිහිකළ සන්ධානයෙහි නායකත්වයෙන් ඉල්ලා අස් වී ඇති බව දැනගැනීමට ලැබුණේ පසුගිය සතියේ ලිපිය ලිවීමෙන් පසුව ය. එබැවින් ඒ ගැන කළහැකි වූයේ වාක්‍යයක් දෙකක් ලිපිය අතරට රිංගවීම පමණ ය. එහෙත් මේ සිද්ධිය වාක්‍යයකට දෙකකට සීමාකළ හැකි නො වෙයි. අද රටේ ක්‍රියාත්මකවන සමස්ත දේශපාලනය ම මේ ඉල්ලා අස්වීමෙන් පිළිබිඹු වෙයි. සන්ධානයේ කෙතෙකුත් පක්ෂ තිබුණ ද වැදගත්වන්නේ ශ්‍රී ල නි පක්ෂය හා ජ වි පෙරමුණ ය. එයට එකතුකළ හැකි තවත් පක්ෂයක් වේ නම් ඒ ම එ පෙරමුණ ය. අඩු වැඩි වශයෙන් ගත්කල මේ පක්ෂ තුනෙහි බහුතරය පනස්හයේ දරුවෝ වෙති. මේ පක්ෂ තුන සන්ධානයේ අනෙක් පක්ෂවලින් වෙන්වන්නේ ද මේ කරුණ හේතුකොටගෙන ය. මෙරට ඇති ප්‍රධාන ම ප්‍රශ්නයක් නම් සංකල්පීය ව සිතීමට සමස්තයක් ලෙස ගත්කල උගතුන් යැයි කියාගන්නා අය දක්වන අදක්ෂතාවය ය. පැහැදිලිව හා නිසියාකාරව නිව්ටන්ගේ චලිත නියම අවබෝධකරගැනීමට නොහැකිවූවෙක් එවැන්නන් කර්තෘ මණ්ඩලයේ සිටින පුවත්පතකින් ජනතාවට භෞතික විද්‍යාව කියා දෙයි. ලිපියක් කියවා තේරුම් නොගෙන එයට ලියන ඊනියා පිළිතුරු පළකිරීමට කැසකවාගෙන සිටින පුවත්පත් කතුවරු මෙරට එමට වෙති. නිශ්චිත අර්ථගෙන දෙන සංකල්ප අවබෝධකරගැනීමට අනුරාධපුර මැදභාගයෙන් පසු සිංහල සංස්කෘතියෙහි එතරම් උත්සාහයක් දරා නැත. මේ හේතුවෙන් පනස්හයේ දරුවෝ යන්න ද නිශ්චිත සංකල්පයක් ලෙස මෙරට භාවිතා නො වෙයි.

පනස්හයේ දරුවන් සිටින්නේ ජ වි පෙරමුණේ පමණක් නොවන බව අප බොහෝ අවස්ථාවල දී කියා ඇති මුත් තමන් විශ්ව විද්‍යාලයක දරුවනට ගණිතය ඉගැන්වූ බව කියාපාමින්  කථිකාචාර්යධුරයක් පරිත්‍යාගකර දේශපාලනයට පිවිසි බව ගෝලබාලයන්ට කියන අවස්ථාවාදියකු වූ ද පනස්හයේ අවජාතක දරුවකු වූ ද ජනතා මිතුරකු තම නෑණ පමණින් පනස්හයේ දරුවන් යන්න අවබෝධකරගෙන ඇත. ඔහුට ද පනස්හයේ දරුවෝ ජ වි පෙ සාමාජිකයෝ ම වෙති. කෙසේ වෙතත් අද මෙරට දේශපාලනයේ ප්‍රබල භූමිකාවක පනස්හයේ දරුවෝ නියැලෙති. ආරම්භයේ දී ම කිවයුත්තක් වෙයි. ශ්‍රී ල නි පක්ෂයේ  පනස්හයේ දරුවන් වෙති යි යන්නෙන් ඒ පක්ෂයෙහි සියල්ලන් ම පනස්හයේ දරුවන් යැයි නො කියැවෙයි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය බණ්ඩාරනායකවරුන්ගේ දරුවකු වුව ද පනස්හයේ දරුවෙක් නො වෙයි. ඇගේ මියගිය සැමියා ද පනස්හයේ දරුවෙක් නො වී ය. ඒ දෙදෙනා ඇතුළු තවත් පිරිසක් මහජන පක්ෂය බිහිකෙළේ සිංහලත්වයට හා එහි පක්ෂය වූ ශ්‍රී ල නි පක්ෂයට විරුද්ධ වෙමින් ය.

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය  නිල වශයෙන් කෙසේ වුව ද, ප්‍රතිපත්තිමය වශයෙන් ශ්‍රී ල නි පක්ෂයේ සාමාජිකාවක් නො වන්නී ය. මහජන පක්ෂය බිහිවූ දිනයේ සිට අද දක්වා ම ඇය ඒ පක්ෂයේ ප්‍රතිපත්ති අනුගමනය කරන්නී ය. 1992 දී පමණ ඇය එංගලන්තයේ සිට මෙරටට ගෙන්වාගැනීමේ දී  මහජන පක්ෂයේ ඇතැමුන් මෙන් ම කසිකබල් පුවත්පතක සිංහල විරෝධී කතුවරයෙක් ද විජාතික බලවේග ද මැදිහත්විය. ඔවුන්ට අවශ්‍ය වූයේ ශ්‍රි ල නි පක්ෂයෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ නායකත්වය ඉවත්කර එතැනට චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය පත්කිරීම ය. එමගින් ශ්‍රී ල නි පක්ෂය සිංහලත්වයෙන් ඉවත්කිරීම ය. කුමාරතුංග මහත්මියගේ ආගමනයෙන් පසු ශ්‍රී ල නි ප මැතිවරණවලින් ජයග්‍රහණය කිරීමට පටන්ගත්තේ ය. එහෙත් එය ඇගේ සුවිශේෂ බලපෑමකින් සිදු වී යැයි කිවහැකි නො වෙයි. ප්‍රේමදාස මහතාගේ මරණයෙන් පසුව ඇති වූ තත්ත්වය සමගින් බණ්ඩාරනායක මහත්මියගේ නායකත්වයෙන් ශ්‍රි ල නි පක්ෂයට ජයග්‍රහණය කිරීමට තිබිණි යැයි සිතිය හැකි ය. එහෙත් වෙනත් විෂයක දී මෙන් නොව ඉතිහාසයේ එවැනි විකල්පවලට ඉඩක් තිබිණි ද නැත් ද යන්න ප්‍රායෝගිකව ම නොකිය හැක්කේ එහි දී සමගාමීව විකල්ප පිරික්සීමට අවස්ථාවක් නොලැබෙන බැවින් ය.

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ නායකත්වයෙන් වුව ද 1994 දී පොදු ජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය කෙළේ සිංහලයන් බහුතරව වාසයකරන ප්‍රදේශවල ය. උතුරු පළාතේ හා මඩකලපු දිස්ත්‍රික්කයේ පොදු පෙරමුණට අත් වූ ජයක් නැත. එහෙත් පසුව පැවති ජනාධිපතිවරණයේ දී නම් කුමාරතුංග මහත්මියට ඒ ප්‍රදේශවලින් ඡන්ද ලැබී තිබුණි. එයට හේතුව වූයේ සිංහල ජනතාව ඇය බණ්ඩාරනායකවරුන්ගේ දියණියක ලෙස සලකා ඡන්දය දුන් අතර දෙමළ ජනයා ඇය කුමාරතුංග මහතාගේ බිරිය නිසා ඇයට ඡන්දය දීම ය. කෙසේ වෙතත් ඉන්පසු පැවැත් වූ මැතිවරණවල දී

© Prof. Nalin De Silva

පෙනී ගිය කරුණ වූයේ සිංහල ජනතාවගෙන් බහුතරය පනස්හයේ දරුවන්ගේ පක්ෂවලට ඡන්දය දෙන බව ය. ඒ නිසා ද අපි ඒ පක්ෂවල සංධානයක් බලාපොරොත්තුවීමු. අද එය සාක්ෂාත් වී ඇත. සන්ධානය යනු චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය නොවන බව පැහැදිලි ව තේරුම් ගත යුතු ය. සන්ධානය ජයග්‍රහණය කෙළේ ඇය නිසා යැයි ඇය සිතනවා ඇත. ඒ එසේ නම් එය මුළුමනින් ම වැරදි සිතුවිල්ලකි. සන්ධානය ජයගන්නේ ඇය සිටිය දී පවා යැයි අපි කියමු. සන්ධානයේ ප්‍රතිපත්තිවලට විරුද්ධව වැඩකරන ඇය සන්ධානයට බරකි. අද ඇත්තේ මේ ප්‍රශ්නය බව අප තේරුම්ගත යුතු ය. විජාතික බලවේගවල අතකොළුවක් වූ කුමාරතුංග මහත්මිය මගින් සිංහල විරෝධී ප්‍රතිපත්තියක් ආණ්ඩුව ලවා අනුගමනය කරවීමට බටහිර බලවතුන්ගේ සිට ආණ්ඩුවේ පත්තරවලට හා අනෙක් කසිකබල් පත්තරවලට ලියන තමන් ප්‍රබුද්ධ යැයි ද ජාතිවාදී නොවේ යැයි ද සිතා සිටින සෑම ඇව්වකු දක්වා  ම සිටින්නෝ උත්සාහ කරති. තමන්ගේ සිතිවිල්ලක් නැති මේ ඇව්වන් තමන්ට හරිහැටි නොතේරෙන කරුණු ගැන බටහිරින් අහුලාගත් යමක් ලියනු ඒ පත්තරවල සාහිත්‍ය හා වෙනත් අතිරේක කියවීමෙන් දැනගත හැකිවෙයි.

විජාතික බලවේගවලට අවශ්‍ය සාමය යනු අන්කිසිවක් නොව ඊළම හෝ එයට පාරකපන ව්‍යුහයක් දෙමළ ජාතිවාදයට ලබාදීම ය. සොල්හයිම් වැනි සිංහල විරෝධී බටහිරයන්ට අවශ්‍ය සිංහලත්වයට විරුද්ධ ව ලන්දේසීන් විසින් ඇතිකෙරී බ්‍රිතානීන් විසින් බෞතීස්ම කෙරුණු දෙමල ජාතිවාදය මෙහෙයවීම ය. සොල්හයිම්ලා හෙල්ගසන්ලා කරන්නේ කොටි ත්‍රස්තවාදීන්ට අවශ්‍ය කොන්දේසිවලට ආණ්ඩුව එකඟකරගැනීම ය. ඔවුහු ආණ්ඩුවේ කොන්දේසි ත්‍රස්තවාදීන්ට නො පිළිගැන්වූහ. අද අන්තර්පාලනයට සන්ධාන ආණ්ඩුව එකඟකරගැනීමට විජාතික බලවේගවලට අවශ්‍ය වෙයි. සාමාන්‍යයෙන් විරුද්ධ පක්ෂයේ සිටින විට දේශපාලන පක්ෂ සිංහලයන්ට පක්ෂ වෙයි. එහෙත් අද ඒ ජා ප ඒ ප්‍රෝඩාව ද අමතක කර අන්තර්පාලනයට පක්ෂවන්නේ සිංහලයන්ගේ කැමැත්තට පයින් ගැසීමට බටහිරයන් තීරණය කර ඇති බැවින් ය. අද ඊනියා සාමකාරයෝ අන්තර්පාලන යෝජනාව සාකච්ඡාවට ගැනීම සඳහා ආණ්ඩුවේ යෝජනා ද ඒ සමග ගෙනඑන්නේ යැයි කියමින් මගෝඩියකට අර අඳිති. එයට ඉඩ දිය යුතු නො වේ. කළ යුත්තේ අන්තර්පාලන යෝජනා අස්කරගැනීමට කොටින්ට බලකිරීම ය. අන්තර්පාලනයට චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය එකඟකරගැනීම අපහසු කරුණක් නොවන්නේ ඇය මහජන පක්ෂ ප්‍රතිපත්ති අනුගමනයකරන හේතුවෙන් ය. එහෙත් සන්ධානය ඒ සඳහා එකඟකරගැනීම ප්‍රශ්නයක් වෙයි. කුමාරතුංග මහත්මිය සන්ධානයේ නායකත්වයෙන් අස්වූයේ ඇයට අවශ්‍ය අන්දමට සන්ධානය මෙහෙයවීමට ඉඩ නොදෙන්නන්ට පාඩමක් ඉගැන්වීමට ය. ජනාධිපති ලෙස සන්ධානයට උඩින් ඊනියා සාම ක්‍රියාවලිය මෙහෙයවීමට ඇය බලාපොරොත්තුවෙයි. ඇය සිතා සිටින්නේ පසුගිය ජනාධිපතිවරණයෙන් ඇයට ඊනියා සාමයක් සඳහා ජනවරමක් ලැබී ඇති බව ය. එය මුළුමනින් ම වැරදි ය. ඇයට සිංහලයන් ඡන්දය දුන්නේ දෙමළ ජාතිවාදයට රට පාවාදීමට නො වෙයි. සිංහලයන්ට සාමය අවශ්‍ය වෙයි. එහෙත් ඔවුන් සාමය යැයි කියන්නේ ප්‍රභාකරන්ගේ බෝම්බ තර්ජනවලට හා බටහිරයන්ගේ ආර්ථික තහංචිවලට යට වී අන්තර්පාලනයක් ලබාදීමට නො වෙයි. ඒ බව පසුගිය මැතිවරණයේ දී සිංහලයන් පෙන්වා දී ඇත. අනෙක් අතට කුමාරතුංග මහත්මිය ද මැතිවරණය ආසන්නයේ දී අන්තර්පාලනයට විරුද්ධ වූවා ය. රට පාවාදීමෙන් කුමාරතුංග මහත්මියට ඇතැම්විට නොබෙල් සාම තෑග්ග ලැබීමට ඉඩ ඇත. නොබෙල් සාම තෑග්ග යනු බටහිරයන්ගේ රූකඩවලට ලැබෙන අධෝවාතයක් තරම්වත් නොවටිනා මුදල්ගොන්නක් හා සංකේතයකි. ඇය එවැන්නක් ලබාගැනීම ගැන අපේ අමනාපයක් නැත. එහෙත් ඇය රට පාවා නොදිය යුතු ය. සන්ධානයේ ප්‍රතිපත්තිවලට එරෙහිව ක්‍රියාකරන කුමාරතුංග මහත්මිය සන්ධානයේ නායකත්වයෙන් අස්වීම ගැන කලබලවීම අනවශ්‍ය ය. අප කළ යුත්තේ ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්තිවලට ද එරෙහිව ක්‍රියාකරන ඇයට ඒ පක්ෂයේ නායකත්වයෙන් ද ඉල්ලා අස්වීමට බලකිරීම ය. අද අවශ්‍යවන්නේ ඒ පක්ෂයේ නායකත්වයට පනස්හයේ දරුවකු පත්කරගැනීම ය.

කුමාරතුංග මහත්මිය සිතා සිටිය ද සන්ධානය දිනන්නේ ඇය නිසා නොවන බව අපි තරයේ කියා සිටිමු. සිංහලයන් බහුතරයට අවශ්‍ය පනස්හයේ දරුවන්ට ආණ්ඩුබලය ලබාදීම ය. සන්ධානයේ සිටින සිංහල විරෝධී පක්ෂවලට ඡන්ද නොමැති බව ජාතික ලැයිස්තුවෙන් හැර වෙනත් අයුරකින් පාර්ලිමේන්තුවට එමට නොහැකි තිස්ස විතාරණ ඩිව් ගුණසේකර ආදී මහත්වරු දනිති. මහජන පක්ෂයට ද සිංහලයන් සලකන්නේ ඒ අයුරින් ම බව පසුගිය මැතිවරණවල දී ඒ පක්ෂයේ අපේක්ෂකයන් ලබාගත් ඡන්දවලින් පැහැදිලි වෙයි. කුමාරතුංග මහත්මියට ද මහජන පක්ෂයේ අපේක්ෂිකාවක් ලෙස ජනාධිපතිධුරයට නොව ප්‍රාදේශීය සභාවකටවත් තරඟකර ජයගැනීමට නො හැකි ය~

© Prof. Nalin De Silva